**ශීර්ෂය 302 - සමූපකාර සේවක කොමිෂන් සභාව**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය නොකළ මතය

සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

## 1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමුපකාර කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපි වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කොමිෂන් සභාව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1 වියදම් කළමනාකරණය**
---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 7 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 45 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන කෙරෙහි අවධානය යොමු කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | මෙම වැය විෂයයන් යටතේ වූ වියදම් මනා පාලනයකින් හා අරපිරිමැසුම්දායක ලෙස සිදු කිරීම හේතු කොට ගෙන ප්‍රතිපාදන ඉතිරිවීම සිදුව ඇත. |

**2.2 ආදායම් රැස්කිරීම**
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කොමිෂන් සභාව ආදායම් ගණන්දීමේ නිලධාර්යෙකු ලෙස කටයුතු කර නොතිබුණත්, රැස්කර තිබුණු රු.157,538 ක ආදායම් 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාරව වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය | වැරදීමකින් ගිණුම්ගත කර තිබීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3 මෙහෙයුම් සමාලෝචනය**
-------------------------

**3.1 සැලැසුම් කිරීම**
---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අභියාචනා 48 ක් විසඳීමට සැලැසුම් කර තිබුණද, සමාලෝචිත | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | අපේක්ෂා කළ ප්‍රමාණයට සේවක පැමිණිලි නොලැබීම මෙන්ම සේවක ආරවුල්වල සංකීර්ණභාවය හේතුවෙන් |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසන් වන විට අභියාචනා 19 ක් හෙවත් සැලැසුම් කළ ප්‍රමාණයෙන් සියයට 39 ක ප්‍රමාණයක අභියාචනා විසදා තිබුණි. | | ආරවුල් විභාග කිරීමට කල්ගත වීම වැනි කරුණු නිසා පැමිණිලි සියල්ල විභාග කිරීමට නොහැකි වී ඇත. තවද, **2018** වර්ෂයේ කොමිෂන් සභා සාමාජිකයින්ගේ නිල කාලය **2018** පෙබරවාරි මාසය වන විට අවසන් වූ අතර විෂයය භාර අමාත්‍යවරයා විසින් කොමිෂන් සභා සාමාජිකයින් **2018** ජූලි මාසයේ දී පත් කර තිබුණි. මෙම කරුණු හේතුවෙන් ලැබුණු පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය පහළ යාමක් සිදුවී ඇත. |
| (ආ) | 2018 වර්ෂයට පෙර ලැබුණු අභියාචනා 57 කින් සමාලෝචිත වර්ෂයේදී අභියාචනා 07 ක් පමණක් විසදා තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂවල ලැබුණු අභියාචනා 50 ක් තවදුරටත් විසදීමට තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | සී.ස. අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සකසුරුවම් සහ ණය දෙන සමිතියේ සේවකයින් විසින් 2016 හා 2017 වර්ෂවල දී පැමිණිලි/අභියාචනා යොමු කර තිබුණි. එම සමිතිය හා සේවකයින් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වීම හේතුවෙන් කොමිෂන් සභාවට ලැබී තිබූ පැමිණිලි විභාග කිරීමට නොහැකි විය. |
| (ඇ) | සමූපකාර සමිති සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීම, අනියම් සේවකයින්ගේ සේවා කාලය දීර්ඝ කිරීම යන ප්‍රධාන කාර්යයන් කොමිෂන් සභාව ඉටු කර තිබුණත්, 2018 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ එම ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා වූ සැලැසුම් ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළ යුතුය. | අලුතින් සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීම, සේවා කාලය දීර්ඝ කිරීම වැනි කරුණු සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගන්නා තීරණ මත සිදුවේ. එම කරුණු පුරෝකථනය කිරීම අපහසු බැවින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක් එක් සමිතිවල අනුයුක්ත කර තිබුණු අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු කොමිෂන් සභාව සතුව නොතිබුණි. | සමූපකාර සමිතිවල කාර්ය මණ්ඩලය පිළිබඳව කොමිෂන් සභාව විසින් තීරණ ගැනීමේදී අවශ්‍ය සමූපකාර සමිතිවල කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර පවත්වාගත යුතුය. | සමූපකාර සමිතිවල කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හා එම තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |